පොලිස් මුලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. — 517
ෆැක්ස් / தொலைநகல் / Fax No. — 011- 2329500
දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605
Website: www.police.lk
ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail — Policemedia@police.lk

මගේ අංකය / எனது இல. / My No. — PMD / PR / 1594 / 21
ඔබේ අංකය / உமது இல. / Your No. —
දිනය / திகதி / Date — 2021.11.26 පැය 1930

# මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## වැලික්ද පොලිස් වසමේදී සිරුරට ගිනි ඇවිලීමෙන් සිදුවූ මරණය සම්බන්ධව.

2021.11.24 වන දින කොළඹ ජාතික රෝහලේ පිලිස්සුම් ප්‍රතිකාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටි වැලිකන්ද පොලිස් වසමේ අංක 68 සඳුන්පිටිය, වැලිකන්ද ලිපිනයේ පදිංචි අයේෂා කුමුදුනී නැමති අය මියයාමේ සිද්ධිය සම්බන්ධයෙන් සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත්තේ ගෑස් ලිප, ගෑස් සිලින්ඩරය හෝ රෙගියුලේටරයේ වයරය ගැලවීමක් හෝ පිලිස්සීමක්, උණුවීමක් හේතුවෙන් සිදුවූ ගිණි ගැනීමක් නොවන බවය.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරීන් (SOCO) විසින් සිදුකරන ලද විමර්ශනයේදී ගෑස් ලිප හෝ ගෑස් සිලින්ඩරය පුපුරායාමක් සම්බන්ධයෙන් වාර්ථා කර නොමැති අතර මේ දක්වා සිදුකල විමර්ශන මගින් අනාවරණය වී ඇත්තේ සිරුරට ගිනි තබා ගැනීමක් මගින් සිදුවූ මරණයක් බවය.

මෙම මරණය සම්බන්ධයෙන් කොළඹ ජාතික රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර මරණයට හේතුව බාහිර පිලිස්සීම් තුවාල වලට විෂබීජ ආසාදනයක් හේතුවෙන් හටගත් මරණයක් බවට නිගමණය කර ඇත. සිද්ධිය සම්බන්ධයන් වැලිකන්ද පොලීසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය,**
**පොලිස් මූලස්ථානය,**
**කොළඹ 01.**